චක්‍රලේඛ අංකය: 16/2017

මගේ අංකය:- පුනරු/යහවිනෝද/2017
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2017.09.06

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

## "යහ විනෝද" භාණ්ඩ නිෂ්පාදනය ආරම්භ කිරීම.

යහ විනෝද භාණ්ඩ නිෂ්පාදනය කිරීම පිළිබඳව මවිසින් නිකුත් කරන ලද 07/92 දරණ 1992.02.13 හා 19/2005 දරණ 2005.10.26 දිනැති චක්‍රලේඛ හා බැඳේ.

සිරකරුවන්ගේ පුනරුත්ථාපන කටයුතු සඳහා සිරකරු සුභසාධක අරමුදල මගින් ප්‍රතිපාදන සලසා දෙන අතර දැනට එකී අරමුදලේ ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහා ලබාදීමට ප්‍රමාණවත් නොමැත.

එබැවින් බන්ධනාගාර ආයතනයන්හි සිරකරු සුභසාධක සංගමයේ ප්‍රාදේශිය කමිටු හා ඒකාබද්ධව යහ විනෝද භාණ්ඩ නිෂ්පාදනය හා විවිධ ව්‍යාපෘතීන් පවත්වාගෙන යනු ලැබේ. මෙම සියළු කටයුතු සිරකරු ශ්‍රමදායකත්වය මත සිදුවන බැවින් ඔවුන්ගේ පුනරුත්ථාපන කටයුතු සඳහා මින් කොටසක් බැර කිරීම ඉතා වැදගත් කරුණකි.

ඉහත පරිදි සිරකරු සුභසාධක අරමුදල තරකර ගැනීමේ අරමුණ ඇතිව යහ විනෝද භාණ්ඩ නිෂ්පාදනය හා අනෙකුත් ව්‍යාපෘති සඳහා ලබාගෙන ඇති අත්තිකාරම් මුදල් ඉහත චක්‍රලේඛණය පරිදි අඩුකර ගැනීමෙන් පසුව ලැබෙන ලාභ බෙදාහැරීම පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| 01. සිරකරු සුභසාධක අරමුදලට | - | 10% |
| 02. සිරකරු සුභසාධක සංගමයට | - | 40% |
| 03. භාණ්ඩ නිෂ්පාදනය කල සිර/සැකකරුවන්ට | - | 40% |
| 04. රජයේ ගිණුමට | - | 10% |

ඒ අනුව මෙකී සංශෝධිත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන මෙන් දන්වමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත් :-

01. බන්ධනාගාර කොමසාරිස් (මුදල්) - දැනගැනීම සඳහා
බන්ධනාගාර මූලස්ථානය

02. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන)- දැනගැනීම සඳහා
බන්ධනාගාර මූලස්ථානය